**අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඝන අපද්‍රව්‍ය හිඟ සේවා ගාස්තු රු.2,791,300 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.2,674,325 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.116,975ක අගයකින් ජංගම වත්කම් සහ වර්ෂයට අදාළ අමතර ආදායම් ආදිය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී විනාශ කළ පුස්තකාල පොත් 614 කට අදාල වටිනාකම ලේඛනවල ගැලපීම් කර නොතිබුණි.

### 1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

වීථි විදුලි පහන් භාවිතය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු විදුලිය පරිභෝජන ගාස්තු රු.316,421 ක් සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකර ගත යුතු ලැබීම් රු.350,321 ක් ආදිය ගෙවීමටත් අයකර ගැනීමටත් කටයුතු නොකර වර්ෂ 22 කට අධික කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

**1.3.4 ලේඛනගත සාක්ෂි නොවීම**

සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1998 වර්ෂය ප්‍රකාර ඉදිරියට ගෙනා ගිණුම් ශේෂ එකතුව රු.2,377,355 ක විෂයයන් 06 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | - | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 4,461,308 | වර්ෂ දෙකක් ඉක්ම වූ ඉකුත් තැන්පතු 90 ක් සම්බන්ධයෙන් සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 576,200 | පරිගණක හා පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,585,750 ක්විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,121,136 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,464,614 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්**

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 533 | 525 | 525 | - | 612 | 353 | 353 | - |
| (ii) | කුලී | 1,700 | 1,941 | 1,941 | 273 | 1,650 | 1,040 | 1,040 | 273 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,705 | 1,071 | 1,071 | - | 1,460 | 1,239 | 1,239 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 21,195 | 18,805 | 15,382 | 6,293 | 19,085 | 18,420 | 17,160 | 2,520 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළ යුතු රු.25,485,000 ක ආදායමින් සමාලෝචිත වර්ෂයේ රු.18,918,939 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 74% ක්ව පැවතුණි.

### 2.2.3 මස් කඩ බදු අයකිරීම

2017 දෙසැම්බර් 31 දිනට පැවැති මස්කඩ බදු රු.273,300 ක් වර්ෂ 04 ක කාලයක සිට අයකරගෙන නොමැතිව හිඟහිටව පැවැතුණි.

### 2.2.4 ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීම

සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශයට ඇතුළත් ප්‍රදේශවල ඉදිකර තිබුණු ව්‍යාපාරික ස්ථාන 29 ක් සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.52,700 ක් 2018 සැප්තැම්බර් 17 දින දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 අනෙකුත් ආදායම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශය තුළ පවතින පුද්ගලික ආයතන විසින් ඔවුන්ගේ විකුණුම් ද්‍රව්‍ය ප්‍රචාරණය කිරීම සඳහා ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු 52 කට අදාල බලපත්‍ර ගාස්තු රු.607,200 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවෙන් අයකර ගත යුතු රු.1,253,542 ක කසළ ගොඩකිරීමේ ගාස්තු හිඟ මුදල් වර්ෂ 02 කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගව ඝාතකාගාරයේ මස් පිණිස ගවයින් 2,671 ක් ඝාතනය කර තිබුණු නමුත් ඒවායේ සම්, සම් භාණ්ඩ නිෂ්පාදනය කරන නිෂ්පාදක ආයතනවලට විකිණීමට කටයුතු නොකර තනි පුද්ගලයෙකුට නොමිලේ ලබාදීම හේතුවෙන් සභාවට රු.400,650 ක ආදායමක් අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතනවලින් ලැබී තිබුණු වර්ෂ 05 කට අධික කාලයක සිට භාවිතා කරනු ලබන වාහන 08 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවකයන් 06 දෙනෙකුට ලබා දී තිබූ රු.144,650 ක ණය, අදාළ සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 02 කට අධික කාලයක සිට හිඟහිටව පැවැතුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව වර්ග 35 කට අයත් අයිතමයන් 238 ක ඌනතාවයක් දක්නට ලැබුණත්, ඒ සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 17 දින වන විටත් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සභාවේ මහජන පුස්තකාලය, පොදු වෙළඳපොල ආසන්නයේ ඉදිකර තිබූ බැවින්, පුස්තකාලයට පැමිණෙන පාඨකයින් වාහන හා මහජනතාවගේ ශබ්ද හේතුවෙන් අසීරුතාවන්ට මුහුණදෙන අතර වෙළඳපොලට පැමිණෙන වාහන පුස්තකාලය ඉදිරිපිට නවතා තැබීම හේතුවෙන් වාහන ගමනාගමනයට අවහිරතාවයන් ද ඇති වී තිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

වැඩ සුපරීක්ෂකවරු, යන්ත්‍ර ක්‍රියාකරු සහ පුස්තකාල නිලධාරීන් වැනි තනතුරු 03 ක් වර්ෂ 02 කට අධික කාලයක සිට පුරප්පාඩුව පැවැති අතර එම තනතුරුවලට අදාල රාජකාරී ඉටුකිරීමේදී කාල ප්‍රමාදයන් සහ ගැටළු මතු වී තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 නිරවුල් නොකළ විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 වර්ෂයේදී අතුරුදහන් වූ රු.96,392 ක් වටිනා විදුලි උපකරණ සහ 2014 වර්ෂයේදී රු.170,000 කට මිලදී ගෙන පාලමුනෙයි ඔලුවිල් ප්‍රධාන මාර්ගයේ සවිකරන ලද සූර්ය බලශක්තියෙන් ක්‍රියාකරන විදුලි බල්බ 2 ක් සහ සවිකිරීම් 2015 දෙසැම්බර් 20 දින සොරකම් කිරීම සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් 17 දින දක්වා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පාලමුනෙයි වෙරළ ළමා උද්‍යානයේ රු.4,817,638 ක වියදමින් වර්ග 06 කට අයත් සෙල්ලම් උපකරණ 11 ක් සභාව විසින් සවිකිරීම් සම්පූර්ණ කර තිබුණි. එසේ වුවත්, එම ළමා උද්‍යානය සඳහා සනීපාරක්ෂක සේවා පහසුකම්, පානීය ජල පහසුකම්, විදුලිබල පහසුකම්, සෙවන ලබාදිය

හැකි ගස් වර්ග සහ ආසන පහසුකම් වැනි කාර්යයන් මේ දක්වා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් මෙම ළමා උද්‍යානය භාවිතා කරන ළමුන්, වැඩිහිටියන් සහ මහජනතාව මහත් දුෂ්කරතාවන්ට මුහුණ පාමින් සිටිති.

(ඇ) 2014 වර්ෂයේ පළාත් සභා සඳහා වෙන්කරන ලද සංවර්ධන සහනාධාර යටතේ ලැබී තිබුණු රු.1,400,000 ක මුදල උපයෝගී කර පල්ලක්කාඩු ග්‍රාමයේ ඉදිකරන ලද සතුන්ගේ ඇටකටු ඇඹරීමේ මධ්‍යස්ථානය සහ ඒ සඳහා මිලදී ගනු ලැබූ යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමට කටයුතු නොකිරීම නිසා 2018 සැප්තැම්බර් 17 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

## 5. පද්ධති හා පාලන

------------------

පහත දැක්වෙන පද්ධති හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් උපයෝජනය සඳහා කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම.<br>(ii) ඝන අපද්‍රව්‍ය සේවා ගාස්තු අයකර ගැනීම. |